


e තක්සලාව
The National e-learning Portal for The General Education
Start Your Learning Journey with e-thaksalawa



## 10. අරාබි තුර්කි ආක්‍රමණ හා ඉන්දියා දේශපාලන තත්ත්වය

### තුර්කි හා අරාබි ආක්‍රමණ හමුවේ ඉන්දියාව මුස්ලිම් බලයට නතුවීම.

අරාබීන් මුලින්ම ඉන්දියාවට පැමිණෙන්නේ වෙළඳ කටයුතු සඳහා ය. එබැවින් අරාබීන් හා ඉන්දියානුවන් අතර පැවති මුල්කාලීන සම්බන්ධතා සාමකාමී විය. නමුත් ඉස්ලාම් ධර්මය බිහිවීමත් සමග ආගම ව්‍යාප්ත කිරීමේ අරමුණින් වෙළඳ අවශ්‍යතාත් හේතුවෙන් අරාබීන් ඉන්දියාව ආක්‍රමණය කිරීමට පෙළඹී තිබේ. සියවස් කිහිපයක් තුළ විටින් විට විවිධ යුද නායකයන් යටතේ එල්ල කරන ලද ආක්‍රමණ අවසානයේ මුස්ලිම් බලය ඉන්දියාව තුළ ස්ථාපිත වී තිබේ.

මදීනාවේ කාලිෆ් වංශයේ දෙවන ඕමාර් කාලිෆ් යටතේ මුල්ම ආක්‍රමණය එල්ල වී තිබේ. බොම්බායේ තානාවලට එල්ල වූ එම ආක්‍රමණය අසාර්ථක විය. දෙවන ආක්‍රමණය බ්‍රෝච් හා දෙබාල්වලට එල්ල වූ අතර එයද අසාර්ථක වී තිබේ. ක්‍රි.ව. 712 දී මුහම්මද් බින් - කාසිම් යටතේ එල්ල කළ තුන්වන ආක්‍රමණයෙන් සින්ධ් හා මුල්තාන් යටත් කිරීම මගින් ප්‍රථම වරට ඉන්දියානු ප්‍රදේශයක් අරාබි පාලනයට නතුවීම සිදුවිය. අරාබීන් විසින් අල්ලාගනු ලැබූ මෙම බටහිර ඉන්දියානු ප්‍රදේශ සියවස් එකහමාරක පමණ කාලයක් සේනා සංයුක්ත පාලන ක්‍රමයක් මගින් පාලනය කොට තිබේ. අරාබීන්ගේ මෙම ජයග්‍රහණයට හේතු වූයේ

- ඉන්දියානු යුධ උපක්‍රමවල දුර්වලතා
- රජු මියයාමෙන් හමුදාව අධෛර්යමත් වීම.
- මුස්ලිම්වරුන්ගේ යුධ උපක්‍රමවල ප්‍රබලතාව
- හින්දූන්ගේ දැඩි ආගමික විශ්වාස
- ඉන්දියානුවන්ගේ අභ්‍යන්තර සමාජීය හා ආගමික භේද
- ප්‍රාදේශීය පාලකයන් අතර ඇති අසමගිය

සින්ධ් හි අරාබි පාලනයක් ආරම්භ වීම නිසා මක්‍රාන් දූර්ගය ප්‍රයෝජනයට ගනිමින් ඉන්දියාවට ඇතුල්වන සංක්‍රමණික පිරිසේ වැඩිවීමක් දැකගත හැකිය. එසේම ඉස්ලාම් ආගම වැළඳගත් තුර්කි ආදී වෙනත් ජාතීන් ඉන්දියාවට ආක්‍රමණය කිරීමට පෙළඹීමක් ද ඉන් සිදුවී තිබේ.

ඉන්දියාව තුළ මුස්ලිම් බලය පැතිරවීමේ වැදගත් පියවරක් වූයේ දහවන සියවසේ අගභාගයේදී එල්ල වූ මුස්ලිම් ආක්‍රමණයන් ය.

- ♦ තුර්කි ආක්‍රමණවල පුරෝගාමියා ලෙස සැලකෙන්නේ සබුක්තිජින්ය. ක්‍රි.ව. 997 ඔහුගේ මරණය සිදුවන විට වයඹදිග පිවිසුම් කපොලු කිහිපයක් හා ඒ අවට ප්‍රදේශ මුස්ලිම්වරුන් සතුවීම.


Copyright © www.e-thaksalawa.moe.gov.lk

- සබුක්තිජින්ගේ පුත් සස්නි මුහම්මද් ක්‍රි.ව. 1000 දී ඉන්දියාව ආක්‍රමණය කිරීම ආරම්භ කිරීම. ඔහු දාහත් වතාවක් ඉන්දියාවට ආක්‍රමණ මෙහෙයවමින් තුර්කි ඇෆ්ගන් බලය ඉන්දියාව තුළ පැතිරවීමට කටයුතු කොට තිබේ. එහිදී සස්නි මුහම්මද් විසින්
  - ⇒ රාජපුත් පාලන ජයපාල පරාජය කරමින් ථානේශ්වරය අල්ලා ගැනීම.
  - ⇒ සෝමනාථ දේවාලයේ ධනය කොල්ලකා විනාශකර දැමීම.
  - ⇒ හින්දු දේවාල හා ප්‍රතිමා විනාශ කිරීම.
  - ⇒ ඉස්ලාම් ධර්මය පැතිරවීමට කටයුතු කිරීම.
  - ⇒ ඉන්දියාව සතුව පැවති විශාල ධනයක් කොල්ල කෑම.

ක්‍රි.ව. 1175 දී ඝෝර්හි මුහම්මද් ඉන්දියාවට ආක්‍රමණ එල්ල කරමින් මුල්තාන් ජයගත් අතර පසුව සින්ධි හා පංජාබ් දක්වා බලය පතුරුවා තිබේ. ක්‍රි.ව. 1192 දී ඇතිවූ සුප්‍රකට තරේන් හි ඇති වූ සටනින් අජ්මේර්හි චෞහාන් රාජවංශික පෘථිවිරාජ් පරාජයට පත්කොට තිබේ. අනතුරුව කනෞජ්හි ජයචන්ද්‍ර රජු පරාජයට පත් කරමින් බෙංගාලය දක්වා බලව පතුරුවා හැර තිබේ.

ක්‍රි.ව. 1206 දී ඝෝර්හි මුහම්මද්ගේ මරණයෙන් පසුව එතෙක් ඉන්දියානු ප්‍රදේශ පාලනය කළ කුතුබ් - උද් - දීන් අයිබෙක් විසින් දිල්ලියේ සුල්තාන්වරයා ලෙස වහල් රාජවංශ ආරම්භ කරන ලදී.


Copyright © www.e-thaksalawa.moe.gov.lk



## ඇගයීම - 01

* **අංක 1 සිට 06 තෙක් සෑම ප්‍රශ්නයකටම නිවැරදි පිළිතුර තෝරා එහි අංකය ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

1. අරාබීන් මුලින්ම අත්පත් කරගනු ලැබූ ඉන්දියානු ප්‍රදේශ මොනවා ද?

   1. සින්ද් හා මුල්තාන් 2. බ්‍රෝච් හා දෙබාල් 3. බොම්බාය සහ තානා
   4. අග්‍රා සහ දිල්ලි 5. දේවගිරි සහ ථානේශ්වර (..........)

2. ඉන්දියාවට එල්ල වූ තුර්කි ආක්‍රමණවල පුරෝගාමියා ලෙස සැලකෙන්නේ කවු ද?

   1. ඔමාර් කාලිෆ් 2. සස්නි මුහම්මද් 3. සබුක්තිජින්
   4. සෝර්හි මුහම්මද් 5. මුහම්මද් බින් කාසිම් (..........)

3. දාහත් වතාවක් ඉන්දියාව ආක්‍රමණය කළ මුස්ලිම් ආක්‍රමණිකයා වන්නේ කවු ද?

   1. කුතුබ්-උද්-දීන් අයිබෙක් 2. බාබූර් 3. සබුක්තිජින්
   4. සස්නි මුහම්මද් 5. අල්හජ්ජාර් (..........)

4. ක්‍රි.ව. 712 දී සින්ධ් ආක්‍රමණය මුල්ම අරාබි ආක්‍රමණිකයා කවරෙක් ද?

   1. සබුක්තිජින් 2. කුටුබ්-උද්දින් අයිබෙක් 3. සස්නි මුහම්මද්
   4. මුහම්මද් බින් කාසිම් 5. සෝර්හි මුහම්මද් (..........)

5. සෝර්හි මුහම්මද් සමග සිදුකරන ලද තරේන් හි සටනින් පරාජයට පත් වූ ඉන්දියානු පාලකයා වන්නේ කවු ද?

   1. ජයචන්ද්‍ර රජු 2. පෘථිවිරාජ් රජු 3. අග්නිමිත්‍ර රජු
   4. වත්සරාජ රජු 5. මහින්දපාල රජු (..........)

6. දිල්ලිය මුල්කරගත් වහල් රාජවංශය ආරම්භ කළේ කවු ද?

   1. සෝර්හි මුහම්මද් 2. හුමායුන් 3. බාබූර්
   4. සබුක්තිජින් 5. කුටුම්-උද්-දීන් අයිබෙක් (..........)

## ඇගයීම - 02

* ක්‍රි.ව. 7 වන සියවසේ පටන් ඉන්දියාවට එල්ල වූ තුර්කි අරාබි ආක්‍රමණ පිළිබඳව විචාරාත්මකව පරීක්ෂා කරන්න.

අන්තර්ගතය සකස් කිරීම : පී. ඒ. වී. මාලි ප්‍රියදර්ශනි - ර/උඩගම මහා විද්‍යාලය , පින්නවල
පරිගණක පිටු සකස් කිරීම : බී.එස්.එස්.කේ. රුහුණගේ මිය- බප/ජය/මුනිදාස තුමාරතුංග විද්‍යාලය, කඩුවෙල
අන්තර්ගතය පරීක්ෂා කිරීම : ඩබ්. දමයන්ති බණ්ඩාර මිය- කොට්ඨාස අධ්‍යාපන කාර්යාලය, පොල්ගහවෙල

Copyright © www.e-thaksalawa.moe.gov.lk